සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

11 S I

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 11 - 2018

විභාග අංකය ....................................    බුද්ධ ධර්මය I    කාලය පැය එකයි

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. බුදුරජාණන් වහන්සේ විසින් පැහැදිලි කර ඇති පරිදි පංචස්කන්ධ නම්,
   I. චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය යනුවෙනි. II. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යනුවෙනි.
   III. ඇස, කණ, නාස, දිව, ශරීරය යනුවෙනි. IV. පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුඛ යනුවෙනි.

2. ''මහණෙනි ඔබට දන් මවක නැත. පියකු නැත. එහෙයින් මෙබඳු අවස්ථාවකදී එකිනෙකා ඔවුනොවුන්ට උපකාරීව සහයෝගයෙන් ක්‍රියා කළ යුතුය.'' බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළේ,
   I. පූතිගත්ත තිස්ස තෙරුන් අරභයාය. II. උදරාබාධිතව පෙළුණු භික්ෂුවක් අරභයාය.
   III. මහා කාශ්‍යප තෙරුන් අරභයාය. IV. මුගලන් මහරහතන් වහන්සේ අරභයාය.

3. බුදුරජාණන් වහන්සේට ද ධර්මයට ද අගුණ කියමින් හා ගුණ කියමින් පැමිණි පරිබ්‍රාජකයා හා අන්තේවාසිකයා පිළිවෙළින් කවරහුද?
   I. බ්‍රහ්මදත්ත හා සුප්‍රබුද්ධ II. සුප්පිය හා සෝණදණ්ඩ
   III. සුප්පිය හා බ්‍රහ්මදත්ත IV. සුප්පිය හා ඉසිදත්ත

4. පූර්වාරාමය බුදුරදුන්ට පූජා කළේ,
   I. අනේපිඬු සිටුතුමා යි. II. බිම්බිසාර මහ රජතුමා යි.
   III. කෝසල මල්ලිකා දේවිය යි. IV. විශාඛා සිටු දේවිය යි.

5. ගිහි ජනයා විසින් භික්ෂූන්ට සිව්පසයෙන් සංග්‍රහ කළ යුතුය. එහි අනුපිළිවෙල නිවැරදිව දැක්විය හැක්කේ,
   I. පිණ්ඩපාත, චීවර, සේනාසන හා ගිලානප්‍රත්‍යය ලෙස ය.
   II. ගිලානප්‍රත්‍යය, චීවර, පිණ්ඩපාත හා සේනාසන ලෙස ය.
   III. චීවර, පිණ්ඩපාත, සේනාසන හා ගිලානප්‍රත්‍යය ලෙස ය.
   IV. සේනාසන, පිණ්ඩපාත, චීවර හා ගිලානප්‍රත්‍යය ලෙස ය.

6. ''මම සසර දුකට මුල්වන පඤ්චස්කන්ධය නැමැති ගෙය තනන වඩුවා සොයා සසර නොයෙක් ජාතිවල ඇවිද්දෙමි.'' මෙම අදහස ඇතුළත් ගාථාව වන්නේ,
   I. අනේක ජාති සංසාරං යන ගාථාවයි.
   II. අග්ගෝ හමස්මි ලෝකස්ස යන ගාථාවයි.
   III. නතං කම්මං කතං සාධු යන ගාථාවයි.
   IV. තුම්හේහි කිච්චං ආතප්පං යන ගාථාවයි.

7. බෝසතාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වය පතා පුරණු ලබන උතුම් පිළිවෙත් සමූහය හැඳින්වෙන්නේ,
   I. දස සක්විතිවත් නමිනි. II. දස පුණ්‍ය ක්‍රියා නමිනි.
   III. දස රාජ ධර්ම නමිනි. IV. දස පාරමිතා නමිනි.

8. බුදුන් වහන්සේ දේශනා කළ පරිදි සිත කිලිටි කරන කුසල් සිත්වලට බාධා කරන සිතුවිලි කුමන නමකින් හඳුන්වයිද?
   I. සේඛියා ධර්ම නමිනි. II. පඤ්ච නීවරණ ධර්ම නමිනි.
   III. පඤ්ච නියාම ධර්ම නමිනි. IV. අෂ්ට ලෝක ධර්ම නමිනි.

9. ''සම්බුදු සසුන බේරා ගැනීමට තවත් විසිපස් වතාවක් ඉපදේවායි'' යන පැතුම ඇතිව අවසන් සුසුම් හෙලුවේ මින් කවුරුන්ද?
   I. පූජ්‍ය රේරුකානේ චන්දවිමල නාහිමියන් ය. II. පූජ්‍ය සිරි දේවමිත්ත හිමියන් ය.
   III. පූජ්‍ය වල්පොල රාහුල හිමියන් ය. IV. පූජ්‍ය අරලිය තැන්නේ නාහිමියන් ය.

10. පුද්ගල සිත සමාධිගත කර ගැනීමට ඉවහල් වන සමථ භාවනාව සඳහා යොදාගත හැකි කර්මස්ථාන ගණන,
   I. 30 කි. II. 25 කි. III. 40 කි. IV. 45 කි.

11. දස රාජ ධර්ම අතරට ඇතුළත් නොවන කරුණ මින් කුමක්ද?
I. දානය II. භාවනාව III. ශීලය IV. මෘදුබව

12. බෝසතාණන් වහන්සේ දාන පරමත්ථ පාරමිතාව පූරණය කළ බව හෙළිවන ජාතක කථාව,
I. වෙස්සන්තර ජාතකයයි. II. සිවි ජාතකයයි.
III. සස ජාතකයයි. IV. මඛාදේව ජාතකයයි.

13. සමථ භාවනාවෙන් ලැබෙන ප්‍රතිඵලයක් නොවන්නේ,
I. මතක ශක්තිය දියුණු වීමයි. II. වහා අවබෝධ කර ගැනීමේ ශක්තිය දියුණු වීමයි.
III. ත්‍රිලක්ෂණයට අනුව ලෝකය දෙස බැලීමයි. IV. පිළිවෙළින් යමක් ඉදිරිපත් කිරීමට හැකි වීමයි.

14. ''සත්හට වන බව දුකට වෙදාණන්'' යන ලෝවැඩ සඟරා කවි පදයට අනුව බුදුරජාණන් වහන්සේ,
I. සසර දුකට ප්‍රතිකාර කරන උතුම් වෛද්‍යවරයකු වන සේක.
II. සත්ත්වයාගේ කායික ලෙඩ දුක්වලට උතුම් වෛද්‍යවරයෙකු වන සේක.
III. සත්ත්වයාට එන ඕනෑම ලෙඩ දුක්වලට ප්‍රතිකාර කළ උතුම් වෛද්‍යවරයකු වන සේක.
IV. උසස් ශල්‍ය වෛද්‍යවරයකු වන සේක.

15. සැරියුත් මහ රහතන් වහන්සේ බුදු සසුනෙහි පැවිදිවීමට පෙර පැවිදිව සිටියේ කවරෙකු සමීපයේද?

I. උපතිස්ස පිරිවැජියා සමීපයේ ය. II. සංජය පිරිවැජියා සමීපයේ ය.
III. කෝලිත පිරිවැජියා සමීපයේ ය. IV. උපක ආජීවකයා සමීපයේ ය.

16. බෞද්ධයාගේ අත් පොත නමින් විරුදාවලියෙන් පිදුම් ලබන ධම්ම පදය අයත් වන්නේ කිනම් නිකාය ග්‍රන්ථයටද?
I. ඛුද්දක නිකායට ය. II. අංගුත්තර නිකායට ය.
III. සංයුත්ත නිකායට ය. IV. මජ්ඣිම නිකායට ය.

17. බුදුපියාණන් වහන්සේගේ ''පුරිසදම්ම සාරථී ගුණයට'' උදාහරණයකි.
I. මට්ටකුණ්ඩලී තරුණයා. II. අංගුලිමාල තරුණයා.
III. සෝපාක තරුණයා. IV. රජ්ජුමාලා තරුණිය.

18. තමා උපමා කොට වරදින් වැළකී සිටීම බුදු දහමේ හැඳින්වෙන්නේ,
I. ධම්මාධිපතෙය්‍ය නමිනි. II. ලෝකාධිපතෙය්‍ය නමිනි.
III. සල්ලේඛ ප්‍රතිපදාව නමිනි. IV. අත්තූපනායික ධර්ම නමිනි.

19. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස ගණයට ඇතුළත් නොවන කරුණක් වන්නේ,
I. කීර්තිය පැතිරීමයි II. මරණින් මතු සුගතියෙහි උපත ලැබීමයි.
III. සිහිමුලාවී කලුරිය කිරීමයි. IV. නිර්භයව ඕනෑම පිරිසක් වෙත යා හැකිවීමයි.

20. දළදා වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරවන අවස්ථාවේ ශ්‍රී ලංකාවේ පාලකයා වූයේ,
I. කිත්සිරි මෙවන් රජතුමා ය. II. පණ්ඩුකාභය රජතුමා ය.
III. පළමුවන විජයබාහු රජතුමා ය. IV. දුටුගැමුණු රජතුමා ය.

21. පුද්ගල නැමැති පංචස්කන්ධය දෙස ගැඹුරින් බැලීම බුදුදහමේ හඳුන්වන්නේ කුමන භාවනාවෙන්ද?
I. බුද්ධානුස්සති භාවනාවෙනි, II. විදර්ශනා භාවනාවෙනි,
III. චිත්තානුස්සති භාවනාවෙනි, IV. ආනාපාන සති භාවනාවෙනි,

22. උණු කළ වතුරට උපමා කර ඇති නීවරණ ධර්මය මින් කුමක්ද?
I. ථීනමිද්ධ නීවර්ණටය. II. කාමච්ඡන්ද නීවර්ණයටය.
III. ව්‍යාපාද නීවර්ණයටය. IV. විචිකිච්ඡා නීවර්ණයටය.

23. ''ස්වාමීනී අපි පස්කම් සුව අනුභව කරමින් අඹු දරවන් නිසා වන කරදර සහිත ව ගිහි ගෙදර වාසය කරමු'' යනුවෙන් බුදුපියාණන් වහන්සේට ප්‍රකාශ කළේ,
I. එක්තරා දෙවියෙකි. II. දීඝජානු කෝලිය පුත්‍රයා.
III. සංජය පිරිවැජියා. IV. නිගණ්ඨනාථපුත්ත තුමාය.

24. පුද්ගලයාගේ පිරිසිදුකම හෝ අපිරිසිදුකම අනෙකෙකුට ලබාදිය හැක්කක් නොව තමා විසින්ම උදාකරගනු ලබන්නකි. මෙම අර්ථය ඇතුළත් ධම්ම පද ගාථාව කුමක්ද?
I. අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති
II. අචරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනේ ධනං
III. සුකරානි අසාධූනී - අත්තනෝ අහිතානිච
IV. නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති

25. දස සක්විතිවත් ඇතුළත් කරමින් දේශනා කළ සූත්‍රය වන්නේ,

I. අග්ගඤ්ඤ සූත්‍රය
II. අස්සලායන සූත්‍රය
III. චක්කවත්ති සීහනාද සූත්‍රය
IV. අම්බට්ඨ සූත්‍රය

26. දුගී පවුලක උපත ලැබුව ද ඉහළ මට්ටමේ රූප ශෝභාව හේතුවෙන් වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට අවස්ථාව උදාවිය හැක්කේ,

I. කාල සම්පත්තියෙනි.
II. ජාති සම්පත්තියෙනි
III. ප්‍රයෝග සම්පත්තියෙනි.
IV. උපධි සම්පත්තියෙනි

27. ප්‍රතිසන්ධිය ලබාදීමට ඉවහල් වන කර්මය වන්නේ,

I. ජනක කර්මයයි.
II. උපත්ථම්භක කර්මයයි
III. උපපීඩක කර්මයයි.
IV. උපඝාතක කර්මයයි.

28. ත්‍රිවිධ රත්නය පිළිබඳ කරුණු දැන ඇති කර ගන්නා පැහැදීම,

I. තුන්තරා බෝධිය නම් වේ.
II. භක්තිය නම් වේ.
III. අමූලිකා ශ්‍රද්ධාව නම් වේ.
IV. අවෙච්චප්පසාදය නම් වේ.

29. ධාර්මිකව උපයා සපයාගත් ධනයක් ඇතැයි සිතා යමෙකු සතුටක් ලබන්නේ නම් එය,

I. අනණ සුඛය නම් වේ.
II. අත්ථි සුඛය නම් වේ.
III. භෝග සුඛය නම් වේ.
IV. අනවජ්ජ සුඛය නම් වේ.

30. නව අරහාදී බුදුගුණ අතර අරහං ගුණය පදනම් කර ගනිමින් බුද්ධ පුත්‍ර හිමි විසින් රචිත ග්‍රන්ථය,

I. සද්ධර්ම රත්නාවලිය ය.
II. කව්සිළුමිණය ය.
III. පූජාවලිය ය.
IV. බුත්සරණය ය.

31. බුදු දහම අන් සියලු ආගම් වලට වඩා වෙනස්ය. ඒ අනුව බුදු දහම ''පටිසෝත ගාමි'' යනුවෙන්ද හඳුන්වයි. ''පටිසෝතගාමි'' යනුවෙන් අදහස් කරන නිවැරදි ම අදහස නම්,

I. යටි ගං බලා පිහිනීම ය.
II. උඩුගම්බලා පිහිනීම ය.
III. දූෂිත සමාජය තුළම සිටීම ය.
IV. අකුසල් කරන මිනිසුන් තුළ සිටීම ය.

32. තුන් දොර අතුරින් සිත මුල් කරගෙන සිදුවන කර්මයක් වන්නේ,

I. බොරු කීමයි.
II. ප්‍රාණඝාතයයි.
III. සොරකම් කිරීමයි.
IV. මිථ්‍යා දෘෂ්ටියයි.

33. අනුරාධපුර මහ සෑයට පමණක් දෙවෙනි වන දුටුගැමුණු රජතුමාගේ අනුස්මරණීය ශාසනික ඉදිකිරීම් අතර අසිරිමත් ගොඩනැගිල්ල වන්නේ,

I. අභයගිරියයි.
II. ලෝවාමහා ප්‍රාසදයයි.
III. මිරිසවැටියයි.
IV. ජේතවනයයි.

34. පඨවි, ආපෝ, තේජෝ, වායෝ යනු සතර මහා භූතයි. එහි පඨවි යන්නෙන් අදහස්වන්නේ,

I. තද ගතියයි
II. ද්‍රව ගතියයි
III. උෂ්ණ ගතියයි
IV. සෙලවෙන ගතියයි

35. බෝසතාණෝ කිං කුසල ගවේසිව සිටි කාලයේදී හමු වූ භාවනාවෙන් සප්ත සමාපත්ති ලැබූ තවුසකු වන්නේ,

I. කොණ්ඩඤ්ඤ තවුසා ය.
II. භද්දිය තවුසා ය.
III. ආලාරකාලාම තවුසා ය.
IV. අසිත තවුසා ය.

36. බුදු දහමේ දැක්වෙන පරිදි ධාර්මික පාලකයෙකු අනුගමනය නොකළ යුතු කරුණක් වන්නේ,

I. සතර සංග්‍රහ වස්තුවයි.
II. දසරාජ ධර්මයයි
III. සප්ත අපරිහානි ධර්මයයි
IV. සතර අගතියයි

37. බුද්ධ ජීවිතය තුළ, වස් කාල 45 ක් බුදු හිමි ගත කර ඇත. ඒ අනුව දසවන වස ගත කළේ,

I. මකුල පර්වතයෙහි ය.
II. පාරිලෙය්‍ය වනයෙහි ය.
III. විශාලා මහනුවර ය.
IV. භේෂකලා පර්වතයෙහි ය.

38. බුදුදහමට අනුව අනුන්ගේ සිත දැන ගැනීමේ ඥානය හඳුන්වනු ලබන්නේ,

I. පුබ්බේනිවාසානුස්සති ඥානයෙනි.
II. චුතූපපාත ඥානයෙනි.
III. පරචිත්ත විජානන ඥානයෙනි.
IV. ආසවක්ඛය ඥානයෙනි.

39. ලෞකික ජීවිත ගත කරන ගිහියාගේ මෙලොව දියුණුව සඳහා මහා මංගල සූත්‍රයේ දක්වා ඇති කරුණු ගණන,

I. 30 කි.
II. 38 කි.
III. 28 කි.
IV. 18 කි.

40. බුදුවරයකු ලොව පහළ වන්නේ මිනිස් වර්ගයා ඉදිරියේ ඇති මහා ගැටලුවක් හෙළිදරව් කිරීමටය. එම ගැටලුව වන්නේ මින් කවරක්ද?

I. කර්මය පිළිබඳ හෙළිදරව් කිරීමටය.
II. සසර දුක හෙළිදරව් කිරීමටය.
III. ප්‍රාණඝාතයේ ආදීනව හෙළිදරව් කිරීමටය.
IV. පරලොව පිළිබඳ හෙළිදරව් කිරීමටය.

(ලකුණු 1 x 40 =40)

සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

11 S II

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 11 - 2018

විභාග අංකය ....................................

# බුද්ධ ධර්මය II

කාලය පැය දෙකයි

**පළමු ප්‍රශ්නය ඇතුලු තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

1.

**i.** මළ දරුවෙකු වඩාගෙන අබ සොයා ගෙන් ගෙට ගිය කාන්තාව කවුද?
**ii.** බෝසතාණන් වහන්සේගේ ගුරුවරුන් දෙදෙනෙකු නම් කරන්න.
**iii.** පංචනීවරණ අතුරින් දෙකක් ලියන්න.
**iv.** සතර බ්‍රහ්ම විහරණ නම් කරන්න.
**v.** විපාක දෙන ආකාරය අනුව කර්මය සතරාකාරය. එයින් දෙකක් නම් කරන්න.
**vi.** සිව්පසය ලියන්න.
**vii.** සරණංකර හිමියන් විසින් ලියන ලද ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
**viii.** බුදුරජාණන් වහන්සේට පළමු දානය හා අවසන් දානය පූජා කළ දෙදෙනා කවුද?
**ix.** සිරිත් සහ විරිත් යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?
**x.** බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය වශයෙන් සැලකෙන ග්‍රන්ථය කුමක්ද?

2.

**i.** බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝසත් උතුමන් විසින් පුරනු ලබන පිළිවෙත් පාරමිතාය. ඒවා අතුරින් දෙකක් ලියන්න.
**ii.** පාරමිතා පූරණය කරන පිළිවෙත් අනුව පාරමිතාවන් බෙදෙන කොටස් තුන නම් කරන්න.
**iii.** පාරමී ධර්ම සමාජ ජීවිතයට වැදගත් වන ආකරය පිළිබඳ පැහැදිලි කරන්න.

3.

**i.** බෞද්ධ භාවනාව දෙයාකාර වේ. ඒවා නම් කරන්න.
**ii.** ඉන් එකක් විස්තර කරන්න.
**iii.** ඇලීම් ගැටීම් වලින් තොරව සාර්ථක ජීවිතයක් ගත කිරීමට භාවනා ඉවහල් වේ. බෞද්ධ භාවනා උපයෝගි කරගෙන යහපත් පුද්ගල සමාජයක් ගොඩ නැගීමට භාවනාව උපයෝගී වන ආකාරය පහදන්න.

4.

**i.** සුකරානි අසාධූ නී යන ධම්ම පද ගාථාව සම්පූර්ණ කර ලියන්න.
**ii.** එහි තේරුම ලියන්න.
**iii.** ධම්මපදය කාල, දේශ සීමා, ජාති, ආගම් ආදී කිසිදු භේදයකින් තොරව සියලු දෙනාට පරිහරණය කළ හැකි උපදේශ ග්‍රන්ථයකි. විමසන්න.

5.

**i.** දසරාජ ධර්ම අතරින් හතරක් ලියන්න.
**ii.** ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න.
**iii.** සාර්ථක නායකයෙකු බවට පත්වීම සඳහා බෞද්ධ දේශපාලන මූලධර්මයන් හේතුවන ආකාරය පිළිබඳව ඇගයීමක් කරන්න.

6.

**i.** චතුරාර්ය සත්‍යය ධර්ම අතරින් දෙකක් ලියන්න.
**ii.** ඉන් එකක් විස්තර කරන්න.
**iii.** ජීවන ගැටළු විසඳා ගැනීමට හා දෙලොව ජීවිතය සාර්ථක කර ගැනීමට චතුරාර්ය සත්‍යය උපයෝගි කරගත හැකිය. සාකච්ඡා කරන්න.

7.

**i.** පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.
1. ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා
2. බුදුරජාණන් වහන්සේගේ තාදී ගුණය
3. ස්තූපය
4. අළුවිහාර සංගායනාව

පළමු වාර පරීක්ෂණය - 2018
බුද්ධ ධර්මය - 11- ශ්‍රේණිය
පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 11 | 2 | 21 | 2 | 31 | 2 |
| 2 | 2 | 12 | 2 | 22 | 3 | 32 | 4 |
| 3 | 3 | 13 | 3 | 23 | 2 | 33 | 2 |
| 4 | 4 | 14 | 1 | 24 | 1 | 34 | 1 |
| 5 | 3 | 15 | 2 | 25 | 3 | 35 | 3 |
| 6 | 1 | 16 | 1 | 26 | 4 | 36 | 4 |
| 7 | 4 | 17 | 2 | 27 | 1 | 37 | 2 |
| 8 | 2 | 18 | 4 | 28 | 4 | 38 | 3 |
| 9 | 2 | 19 | 3 | 29 | 2 | 39 | 1 |
| 10 | 3 | 20 | 1 | 30 | 3 | 40 | 2 |

(ලකුණු 1 x 40= 40)

## II කොටස

1.
**i.** කිසාගෝතමී / කිසාගෝතමී තෙරණිය
**ii.** ආලාරකාලාම, උද්දකරාමපුත්ත, භග්ගව
**iii.** කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්දය, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්චාව
**iv.** මෛත්‍රා, කරුණා, මුදිතා, උපේක්ඛා
**v.** ගරුක ආචිණ්ණ, ආසන්න, කටත්තා
**vi.** චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස
**vii.** මුණිගුණ අලංකාරය, සාරාර්ථ සංග්‍රහය, රත්නත්‍රය ප්‍රණාම ගාථා සන්නය, සතර බණවර සන්නය
**viii.** සුජාතා සිටුදුව, චුන්දකර්මාර පුත්‍රයා.
**ix.** සිරිත් - කළ යුතු දේ
විරිත් - නොකළ යුතු දේ
**x.** ධම්මපදය

(ලකුණු 2 x 10= 20)

2.
**i.** 1. දාන 2. සීල 3. නෙක්ඛම්ම 4. පඤ්ඤා 5. වීර්ය 6. ඛන්ති 7. සච්ච 8. අධිට්ඨාන 9. මෛත්‍රා 10. උපේක්ඛා

(ලකුණු 02)

**ii.** පාරමී, උප පාරමී, පරමත්ථ පාරමී (ලකුණු 03)

**iii.** සදාචාරවත් ජීවිතයකට දාන සීලාදී ගුණදහම් වටිනා මඟ පෙන්වීමක් කරයි. බුද්ධකාරක ධර්ම පුරන බෝසතුන් මෙම ගුණධර්මය පූරණය කරනු ලබයි. පරිත්‍යාගශීලිත්වය කායික, වාචසික සංවරය හරි අවබෝධයෙන් යුතු ඉදිරි දැක්ම, ලෝකය දෙස සැබෑ ඇසින් දැකීම, සත්‍ය ගරුකවීම, ලෝකයට හිතවත් වීම, අධිෂ්ඨානය උපේක්ෂාවෙන් යුතුව ජීවිතය ගොඩ නැගීම තුළින් පුද්ගල සමාජ ජීවිතයක් මැනවින් තහවුරු කර ගැනීමට හැකිවේ. (පාරමිතා අතරින් 4 වත් ගෙන විස්තර කර ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.)

(ලකුණු 05)

3.
**i.** සමථ භාවනාව (චිත්ත සමාධි භාවනාව)
විදර්ශනා භාවනාව (ත්‍රිලක්ෂණ, ප්‍රඥා)

(ලකුණු 02)

**ii.** **සමථ භාවනාව**

සිත සංසුන් කරන භාවනාව සමථ භාවනාවයි.
සමථ භාවනාව චිත්ත භාවනාව, සමාධි භාවනාව නමින්ද හැඳින්වේ.
සමථ භාවනාවෙන් පංචනීවරණ ධර්ම යටපත් කෙරේ.
සමථ භාවනා කර්මස්ථාන 40 කි.

(ලකුණු 03)

**විදර්ශනා භාවනාව (විපස්සනා) විසේසේන පස්සතී විපස්සනා**

පංචස්කන්ධය දෙස ගැඹුරින් බැලීම විපස්සනා භාවනාවය. විපස්සනා භාවනාව ප්‍රඥා භාවනාව ත්‍රි ලක්ෂණ භාවනාව, ලෙසද හැඳින්වේ. රූප, වේදනා, සංඥා සංඛාර විඤ්ඤාණ පංචස්කන්ධය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලෙස ප්‍රඥාවෙන් දැකීම නිර්වාණයට මඟ සලසන විදර්ශනාවෙන් සිදු වේ.

**iii.** මිනිස් සිත නිරන්තරයෙන් විසිරී පවතී. විසිරුන සිත ඒකරාශී කර ගැනීම අපහසු කරුණකි. නමුත් යමෙකුට මෙකී සිත පාලනය කරගත හැකි වේ නම් විවිධ ඇලීම් ගැටීම් වලින් තොරව සාමකාමී ජීවිතයක් ගොඩනගා ගැනීමට හැකිවේ. සියලු ගැටුම් වලට මුල් වන්නේ තම සිතය. තම චිත්ත සංයමය තුළින්

තමාටම එය පාලනය කර ගත හැකිය. සමස්ත මානවයා ම ඒ අයුරින් ක්‍රියා කරන්නේ නම් තමා ඇතුළු සමස්ත ප්‍රජාවට ම සාර්ථක ජීවිතයක් ගොඩනගා ගැනීමට හැකි වේ. මේ සඳහා මූලික වන්නේ භාවනාවයි. භාවනාව යනු වැඩීමයි. එනම් කුසල සිත්හි පිහිටුවීමයි.

(ලකුණු 05)

4.

**i.** සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානිච
යං වේ හිතංච සාධුංච - තං වේ පරම දුක්කරං (ලකුණු 02)

**ii.** තමාට අහිතවත් වූ අයහපත් දේ කිරීම පහසුය. යම් දෙයක් තමාට වැඩදායකද යහපත පිණිස පවතීද එවැනි දේ කිරීම ඉතා පහසුය. (ලකුණු 03)

**iii.** ධම්මපදය සියලු දෙනාට පරිහරණය කළ හැකි වටිනා ග්‍රන්ථයකි. බොහෝ උපදේශ මගින් ජීවිතාදර්ශ ලබාදෙයි. බෞද්ධයන්ට පමණක් නොව ජාති, ආගම් භේදයකින් තොරව ඕනෑ අයෙකුට එයින් ලබාදෙන ආදර්ශ ජීවිතයට බද්ධ කරගත හැකිය. ඒනිසාම ලෝකයේ පරිශීලන ග්‍රන්ථ අතර, ධම්මපදයට සුවිශේෂී තැනක් හිමිවේ. (ගාථා උදාහරණයට දක්වා ලියා ඇත්නම් පූර්ණ ලකුණු දෙන්න.) (ලකුණු 05)

5.

**i.** දානං සීලං පරිච්චාගං - අජ්ජවං මද්ද වං තපං
අක්කෝ ධං අවිහිංසං ච - ඛන්තිං ච අවිරෝධනා

(ලකුණු 02)

**ii.** දානය, සීලය, පරිත්‍යාගය, ඍජු බව, මෘදු බව, තපස අක්‍රෝධය, අවිහිංසාව, ඉවසීම, අවිරෝධතා

(ලකුණු 03)

**iii.** ඉහත කරුණුවලින් දෙකක් කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (10 ශ්‍රේණිය බුද්ධ ධර්මය පෙළ පෙතේ 22 පාඩම පාලකයන් මඟ කියන බුදුදහම පිටුව 156) (ලකුණු 05)

6.

**i.** දුක්ඛ ආර්ය සත්‍යය (දුක පිළිබඳව දැන ගැනීම සත්‍යය)
දුක්ඛ සමුදය ආර්ය සත්‍යය (දුක හට ගැනීම පිළිබඳ උතුම් සත්‍යය)
දුක්ඛ නිරෝධාර්ය සත්‍යය (දුක නිවීම පිළිබඳව උතුම් සත්‍යය)
දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාර්ය සත්‍යය (දුක නිවීමේ මාර්ගය පිළිබඳ උතුම් සත්‍යය)

(ලකුණු 02)

**ii.** (10 ශ්‍රේණිය බුද්ධ ධර්මය පෙළ පොතේ 15 පාඩමේ සිව්සස් හැඳින සැනසීම ලබමු (පිටුව 82) චතුරාර්ය සත්‍යය පිළිතුර සළකා බලා ලකුණු ලබා දෙන්න. (ලකුණු 03)

**iii.** උපන්දා සිට මියයන තුරු පුද්ගලයින්ට විවිධ ගැටළු වලට මුහුණදීමට සිදුවේ. එම ගැටළුව, ගැටළුවට හේතුව, ගැටළුව නිරාකරණය හා නිරාකරණය කිරීමේ මඟ අවබෝධ කර ගැනීම තුළින් අප හමුවේ එන සියලු ගැටළු වලින් නිදහස් විය හැකිය. බුදු හිමියන්ගේ චතුර්ර්ය සත්‍යය ධර්මයෙන් පෙන්වා දෙන්නේද ඒ ආකාරයේම සසර දුකින් මිදීමේ මඟය. සිසුන් හා ඉන් ඔබ්බට ගිය තරුණ මහලු පිරිස් තම ගැටළු නිවැරදිව අනාවරණය කොට සිව්සස් දහම පිළිපැදීම තුලින් මෙලොව ජීවිත මෙන්ම පරලොව ජීවිතද සාර්ථක කරගත හැකිය. සමස්තය සළකා බලා ලකුණු දෙන්න. (ලකුණු 05)

7.

**i. ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා**
ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ ජීවන චරිතයට අදාළ තොරතුරු දක්වා ආගමික හා ශාසනික සේවාවන් පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු සඳහන් කරමින් පිළිතුරු ගොඩනගා ඇතිනම් සම්පූර්ණ ලකුණු ප්‍රදානය කරන්න. 10 ශ්‍රේණිය බුද්ධධර්මය පෙළ පොත සසුන් කෙත සරුකළ උතුමෝ ගුණැති පෙර කළ පිටුව 34

(ලකුණු 05)

**ii. තාදී ගුණය**
බුදුරජාණන් වහන්සේගේ අටලෝ දහමින් කම්පා නොවීමේ ගුණය තාදී ගුණය නම්වේ. ඒවා විස්තර කරමින් ගොඩ නගා ඇති පිළිතුරකට සම්පූර්ණ ලකුණු ලබාදෙන්න. 10 ශ්‍රේණිය බුද්ධ ධර්මය පෙළපොත බුදුගුණ අනන්තයි. 2 පාඩම 13 පිටුව

(ලකුණු 05)

**iii. ස්තූපය**
සමස්ත පිළිතුර සලකා බලා ලකුණු ප්‍රදානය කරන්න. 10 ශ්‍රේණිය 20 පාඩම හෙළ කලාවන් සුරකිමු. පිටුව 108

(ලකුණු 05)

**iv. අළුවිහාර සංගායනාව**
මාතලේ අළුවිහාරයේදී පවත්වනු ලැබූ ධර්ම සංගායනාව වලගම්බා රජු කළ පවත්වන ලද්දකි. බැමිණිතියා සාගතය දකුණු ඉන්දීය ආක්‍රමණ හා නිකාය භේදය නිසා ඇති වූ බරපතල ශාසනික ගැටළු මුල් කරගෙන මෙම සංගායනාව පැවැත් වූ අතර මෙහි මූලික අරමුණ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඨ කිරීමය. මෙය ලාංකික සංසරත්නයේ යුග මෙහෙවරකි.
10 ශ්‍රේණිය - 19 පාඩම බුදු සසුන සුරැකි සංගායනා පිටුව 102

(ලකුණු 05)